මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..............................................................................................

## 1 පත්‍රය

- **සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 – 05 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. ඵලදායිතා සංකල්පයට අයත් "සෙයිසෝ" යන ජපන් වචනයේ සිංහල තේරුම වන්නේ,

I සංවිධිත බව  II සුපිළිවෙළ
III සුපිරිසිදු බව  IV සම්මතකරණය

02. පුද්ගල බාහිර පෙනුම දියුණු කරන පිරිසිදු බවට අදාළ නොවන ලක්ෂණයක් වන්නේ,

I දත් පිරිසිදුව තබා ගැනීම.
II නිය අලංකාරව තබා ගැනීම.
III පිළිවෙළට සකස් කළ හිසකෙස් තබා ගැනීම.
IV අපිරිසිදු ඇඳුමින් සැරසී සිටීම.

03. නිවැරදි ඇවිදීමකදී පළමුවෙන් ම පොළොවට ස්පර්ශ විය යුත්තේ,

I ඇඟිලි  II විලුඹ
III පාදය  IV පාද කොට්ටා

04. සුළු ක්‍රීඩාවක් සඳහා උදාහරණයකි,

I වොලිබෝල්  II ක්‍රිකට්
III කවුද රජා  IV නෙට්බෝල්

05. ක්‍රීඩා නීති රීති හා ආචාර ධර්ම සුරැකීමෙන් ,

I ගැටළු ඇතිවේ.  II අනතුරු සිදුවේ.
III උද්යෝගය අඩුවේ.  IV සත්‍ය ජයග්‍රහණ ලැබේ.



LIVEWORKSHEETS

**ප්‍රශ්න අංක 6 – 10 දක්වා ගැළපෙන නිවැරදි පිළිතුර යා කරන්න.**

| | |
|---|---|
| 06. සමාජීය යහපැවැත්ම | I. කොටු පැනීම |
| 07. එඬේර යුගය | II. සහකම්පනය |
| 08. සුළු ක්‍රීඩාවකි | III. කුඩාරම් |
| 09. මහා පෝෂක | IV. ස්වස්තථාවය |
| 10. පිරිසිදු බව | V. කාබෝහයිඩ්‍රේට් |

**ප්‍රශ්න අංක 11 – 15 දක්වා වරහන් තුළ දී ඇති නිවැරදි පිළිතුර තෝරාගෙන හිස්තැන් පුරවන්න.**

11. දරුවකු අවම වශයෙන් පැය ............................................ නිදා ගැනී අවශ්‍යය

12. අප ගන්නා වේලක අඩංගු ආහාර ප්‍රමාණයෙන් ½ ක් ....................................... ආහාර විය යුතුය

13. කිසි විටෙකත් ......................................... සෘජුව තබා පතිත වීම නොකළ යුතුය.

14. පාපන්දු ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ ආරම්භ වූයේ ................................................ වසරේ දීය.

15. ..................................................... ඉරියව් නිසා අනතුරු ද ආබාධ ද ඇති වේ.

( 1911 , 8 – 10 , පිෂ්ටමය , පාද , වැරදි , ශරීරය)



LIVEWORKSHEETS

**ප්‍රශ්න අංක 16 – 20 දක්වා වාක්‍ය හරිනම් හරි (√) ලකුණ ද , වැරදි නම් වැරදි (×) ලකුණ ද යොදන්න.**

16. ඔබට වයසට නිසි උසක් තිබිය යුතුය. ( )

17. මිනිසාගේ මූලික අවශ්‍යතා වන්නේ වාතය, ජලය හා ආහාර ය. . ( )

18. ඉරියව් පවත්වා ගැනීමේදී ශරීරයේ කොඳු ඇට පෙළ ප්‍රධාන අංගයක් නොවේ. ( )

19. සුළු ක්‍රීඩා සඳහා සම්මත නීතිරීති ඇත. ( )

20. ප්‍රෝටීන් සහිත ආහාරවලින් සිරුරට ශක්තිය ලබා දේ. ( )



LIVEWORKSHEETS